ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 2025 . 08. 11

කේ.ඒ.එස්. අනෝජා කුමාරි
455, පහළ ගෙදර,
උඩුදෙණිය,ගම්පොල.

**පැමිණිලිකාර පාර්ශවය**

කේ.ඒ. දිනේශ් සෙනෙවිරත්න
455, පහළ ගෙදර,
උඩුදෙණිය,ගම්පොල.

**වින්දිත පාර්ශවය**

1. පො.කො.79375 චින්තක
   මූලස්ථාන පොලිස් ස්ථානය,ගම්පොල.
2. පො.කො.103735 ජයසිංහ
   මූලස්ථාන පොලිස් ස්ථානය,ගම්පොල.
3. පො.සැ.68721 සමරකෝන්
   මූලස්ථාන පොලිස් ස්ථානය,ගම්පොල.
4. පො.ප.කුමාරසිංහ
   ස්ථානාධිපති, දූෂණ මර්ධන අංශය,
   මූලස්ථාන පොලිස් ස්ථානය,ගම්පොල.
5. මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක
   මූලස්ථාන පොලිස් ස්ථානය,ගම්පොල.

**වගඋත්තරකාර පාර්ශවය**

**<u>පැමිණිලි අංකය:- HRC/KND/361/24-A</u>**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකාරිය විසින් 2024.06.26 වන දින කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් කියා සිටින්නේ ඇයගේ ස්වාමි පුරුෂයා වන කේ.ඒ. දිනේශ් සෙනෙවිරත්න යන අයට 2024.06.24 වන දින කිසිදු හේතුවක් දැනුම් දීමකින් තොරව ගම්පොළ මූලස්ථාන පොලිස් ස්ථානයේ නිලධාරීන් පිරිසක් විසින් නිවස ඉදිරිපිට මාර්ගයේදී අමානුෂික ලෙස තලා පෙලා දමා අනතුරුව නිවසට පැමිණ

ඇයගේ ස්වාමි පුරුෂයාගේ නිදන කාමරයට ස්වාමි පුරුෂයා ඇදගෙන ගොස් අමානුෂීය ලෙස පහර දී තුවාල සිදු කර ඇති බවත් ය. තවද, තම ස්වාමි පුරුෂයාගේ කරේ තිබූ රන් මාල පොටද පොලිස් නිලධාරීන් විසින් පහරදෙනු ලැබූ අවස්ථාවේදී අස්ථාන ගත වී ඇති බවත්, නිදන කාමරයේ තිබූ ස්වාමි පුරුෂයාගේ මුදල් පසුම්බියේ තිබූ රු. 63,000.00ක මුදල පොලිස් භාරයට ගත් බවත්, නැවත එම මුදල අධිකරණයට ගෙන ගොස් රු. 53,000.00ක මුදලක් අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත් ඉතිරි රු. 10,000.00 ක මුදල ද පොලිස් නිලධාරීන් භාරයේ තිබියදී අස්ථාන ගත වී ඇති බවත්, ස්වාමි පුරුෂයාගේ ජංගම දුරකතනය ද පොලිස් භාරයට ගත් බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

තවද, තම ස්වාමි පුරුෂයා පොලිස් ස්ථානයට ගෙන ගොස් රාත්‍රී 8.00 ට පමණ රෝහලට රැගෙන ගොස් ඇති බවත්, එක් නිලධාරියෙකු විසින් රෝහල් පොලීසියට දුරකථන ඇමතුමක් ලබා දී ඒ වේලාවේ දී රෝහලේ සිටින වෛද්‍යවරයා කවුරුදැයි විමසා පුද්ගලික ත්‍රීරෝද රථයකින් ගම්පොල රෝහලට රැගෙන ගොස් ඇති බවත්, එම රෝහල් සිටි වෛද්‍යවරයා විසින් තම ස්වාමි පුරුෂයා හට කිසිදු රෝගයක් නැති බව පවසා ඇති බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

ඉන්පසු පො.ප. කුමාරසිංහ නිලධාරියාගේ උපදෙස් මත ක්‍රියා කර නැවත තම ස්වාමි පුරුෂයා පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් පො.ප. කුමාරසිංහ නිලධාරියා සහ අපරාධ අංශයේ පොලිස් නිලධාරීන් හතර දෙනෙකු විසින් අමානුෂික ලෙස තම ස්වාමි පුරුෂයා හට පහර දී ඇති බවත්, තම ස්වාමි පුරුෂයා වන දිනේශ් සෙනෙවිරත්න යන අය නැවත නැවතත් ඉල්ලීම් සිදු කළ ද ඔහුව රෝහල වෙත රැගෙන යාම ප්‍රතික්ෂේප කර ඇති බවත්, හෙරොයින් සහ අයිස් මත්ද්‍රව්‍ය පොලීසියෙන් අතින් ගෙනත් දමා වැරැද්ද පිළිගන්නා ලෙස තම ස්වාමි පුරුෂයා හට තරයේ ප්‍රකාශ කර ඇති බවත්, වැරැද්ද පිළිනොගතහොත් එක් අවුරුද්දකට සිරගත කරන බවට දැනුම් දී ඇති බවත් පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත.

<u>වින්දිත පාර්ශවයේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන කේ.ඒ. දිනේශ් සෙනෙවිරත්න යන අය මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා වන අතර, බන්ධනාගාරයෙන් ඇප පිට නිදහස් වීමෙන් පසු කොමිෂන් සභාව වෙත 2024.11.04 වන දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් කියා සිටින්නේ තමා 2024.06.24 වන දින නිවස අසල තමාට හිමි තේ වත්ත ඉදිරිපිට සිටියදී මාර්ගයේ යතුරු පැදියකින් පැමිණි දෙදෙනෙක් තමන් අසල යතුරුපැදිය නතර කොට දිනේෂ් යන අයගේ නිවස කොහේදැයි ඇසූ බවත්, තමා දිනේෂ් බව ඔවුන් හට පැවසූ බවත්, එසේ පැවසුව සැනින් තමාගේ සරමෙන් අල්ලා අත් මාංචුවක් රැගෙන තමා හට මාංචු දැමූ බවත්, ඉන් අනතුරුව තම නිවස පෙන්වන ලෙසට ඔවුන් අණ කළ බවත්, ඒ අතරතුර තමා හට පහර දුන් බවත් ය.

නිවසට පැමිණ තමා සිටිනා කාමරය පෙන්වන ලෙස පැවසූ බවත්, තමන් ඔවුන්ව කාමරය තුලට රැගෙන ආ බවත්, " උඹ පොලිසිය එක්ක නඩු කියන්න ලොකු මිනිහෙක් ද " යනුවෙන් පවසා අතින්

පයින් තමා හට පහර දුන් බවත්, "උඹට කුඩු කැල්ලක් දමා පොඩි නඩුවක් දානනම්. ඒක බාර ගනින් " යැයි පැවසූ බවත්, තමා එයට තදින්ම විරුද්ධ වූ බවත්, එය භාර නොගතහොත් තම බිරිඳ සහ දියණිය දූෂණය කරන බවට පැවසූ බවත්, තමා හට බිම දමා අතින් පයින් ඉතා අමානුෂික අන්දමින් පහර දුන් බවත් වින්දිත පාර්ශවය විසින් සඳහන් කර ඇත.

එසේම, තම බිරිඳ, ඥාති සහෝදරයා, පියා සහ අවුරුදු 08ක් වයසැති දියණිය මේ ශබ්දයට කාමරයට පැමිණි බවත්, එම අවස්ථාවේ දී නිලධාරීන්ගේ පහර දීම නිසා තමා ඇඳ සිටි සරම ගැලවී බිමට වැටුණු බවත්, ඒ අවස්ථාවේදී බිරිඳ, ඥාති සහෝදරයා, පියා සහ දියණිය ඉදිරියේ දී ඇති වූ දැඩි කම්පනය නිසා සරම ඇඳ ගැනීමට දැඩි පරිශ්‍රමයක් යෙදූ බවත්, ඒ අවස්ථාවේදී ද දැඩි ලෙස තමන්ට පහර දුන් බවත්, තමා අමාරුවෙන් වැටී තිබූ සරම ඇඟිද ගත් බවත් වින්දිත පාර්ශවය විසින් සිය දිව්රුම් ප්‍රකාශය තුළින් දක්වා ඇත.

ඉන්පසුව ඔවුන් කාමරයේ හැමතැනම හොයා බැලූ බවත්, කාමරයේ ඇඳ අසල ඇති කුඩා මේසය උඩ තිබූ තමාගේ මුදල් පසුම්බිය සහ දුරකතනය රැගෙන එක නිලධාරියෙක් මුදල් පසුම්බියේ තිබූ මුදල් තමාට ගණන් කරන ලෙස පැවසූ බවත්, තමා එය ප්‍රතික්ෂේප කළ පසු එක් නිලධාරියෙකු තම බිරිඳ සහ ඥාති සහෝදරයා බලා සිටිය දී මුදල් ගණන් කර රු.63,000.00ක මුදලක් එහි ඇති බව පවසා නැවතත් තමාට පහර දෙමින් නිවසින් එළියට ඇදගෙන ගොස් එම ස්ථානයට පැමිණ තිබූ ත්‍රීරෝද රථයට බලෙන් නංවා ගෙන පිටත් වූ බවත්, ඒ අතරතුරදී තමා කෑ ගසා තමාගේ ඥාති සහෝදරයාටද ත්‍රීරෝද රථයට නගින ලෙස ඉල්ලා සිටි බවත් වින්දිත පාර්ශවය විසින් සඳහන් කර ඇත.

ඉන්පසු තමාව ගම්පොළ පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්, පොලිස් ස්ථානයේ අපරාධ අංශයට රැගෙන ගොස් එහි දොර වසා දමා පැයක පමණ කාලයක් පොලිස් නිලධාරීන් විසින් තමාට ඉතා අමානුෂික ලෙස පහර දුන් බවත්, ඒ අතරතුර තමාගේ ඥාති සහෝදරයාට "උඹ මෙතන සිටින්නේ ඇයි" දැයි පවසා ඔහුව පලවා හරිනු ලැබූ බවත්, තමාගේ නහයෙන් හා කනෙන් ලේ එන බව දැක පහර දීම නවත්වන්න යැයි නිලධාරියෙක් පැවසූ බවත්, තමාට ඉතාමත් අසාධ්‍ය බැවින් තමාව රෝහලට ගෙන යන ලෙස කෙතරම් ඉල්ලීම් කළ ද එක නිලධාරියෙකු හෝ තම ඉල්ලීම සළකා නොබැලූ බවත් වින්දිත පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

ඊට පැය භාගයකට පමණ පසුව තවත් පොලිස් නිලධාරියෙක් නොවන පුද්ගලයෙකු තමා වැටී සිටි ස්ථානයට පැමිණ තමාව උස්සා බැලූ බවත්, එවිට එම තැනැත්තා විසින් "මොහුට අමාරුයි මොනවා හරි සිදු වෙලා" යැයි පැවසුව බවත්, එවිට එම ස්ථානයේ සිටි තවත් නිලධාරියෙක් දුරකථන ඇමතුමක් ලබාගෙන "එකෙක් ඉන්නවා. රෝහලට ගේන්න ඕන" යැයි පැවසූ බවත්, මද වේලාවක් කතා කොට දුරකථනය විසන්ධි කළ බවත්, ඉන්පසු ඔහු එතන සිටි අනෙක් නිලධාරීන්ට "දැන්ම ගේන්න එපා. මැඩම් ඉන්නේ. තව පැයකින් විතර ගේන්න. එයත් එක්ක ඒවා බෑ"යැයි පවසූ බවත්, එය තමන්ට හොඳින් ඇසුනු බවත්, ඊට පැය භාගයකට හෝ විනාඩි 45කට පසු තමාව ත්‍රී රෝද රථයකට නංවා ගෙන පොලිස් නිලධාරීන් විසින් ගම්පොල මූලික රෝහලේ රෝගීන් ඇතුලත් කරන ස්ථානයට

රැගෙන ගොස් එතන සිටි වෛද්‍ය නිලධාරියාට " මූ කුඩු, සල්ලි රු 14,000.00 ගිලලා ඉන්නේ" යැයි පැවසූ බවත්, එවිට එම ස්ථානයේ සිටි වෛද්‍යවරයා සිනහ වී තමාව පරීක්ෂා නොකොට පොලිස් නිලධාරීන් හට "වැඩේ හරි. එක්කන් යන්න යැයි" පැවසූ බවත්, එම අවස්ථාවේ රෝගීන් ඇතුලත් කරන තැනින් තමාව එළියට රැගෙන ගොස් ත්‍රීවීල් රථයට නැංවීමට උත්සහ කිරීමේදී තමා දගලමින් කෑ ගසා තමා යම් දෙයක් ගිලලා යැයි පවසනවා නම් එය පරීක්ෂා කරන ලෙස සහ තමාගේ ශරීරයේ මත්ද්‍රව්‍ය ශරීර ගත වී ඇත්නම් එය කුමන හෝ ආකාරයෙන් පරීක්ෂා කර තමාට වෛද්‍ය ප්‍රතිකාර ලබාදෙන ලෙස කෑගසමින් පොලිසියත් සමඟ පොර බදමින් විනාඩි 10ක් 15ක් පමණ එම ස්ථානයේ දැගලූ බවත් වින්දිත පාර්ශවය විසින් සඳහන් කර ඇත.

ඉන් අනතුරුව රෝහලට රැගෙන ගිය පොලිස් නිලධාරීන් තිදෙනා තමාව බලෙන්ම ඇදගෙන ත්‍රීරෝද රථයට ඇතුළු කර ගත් බවත්, ගම්පොල රෝහල් පරිශය පසුවෙනවාත් සමඟ ත්‍රීරෝද රථයේදීම බිම දමාගෙන තමාව පාගාගෙන පොලිස් ස්ථානයට රැගෙන යන අවස්ථාවේදීත් පහර දුන් බවත්, අනතුරුව පොලිස් ස්ථානයට රැගෙන ගොස් අපරාධ අංශයට ගෙනගිය බවත්, එම ස්ථානයේ සිටි නිලධාරීන් සමඟ එකතු වී නැවතත් පහර දී ඒ අතරතුර "තෝ මේක භාර ගත්තේ නැත්නම් තොට ඊළඟට බෝම්බයක් දමා අත්අඩංගුවට ගන්නවා" යැයි පවසමින් නැවතත් පහර දුන් බවත්, තමා මද වේලාවක් සිහසුන්ව සිටි බව පසුව දැනගන්නට ලැබුණු බවත් වින්දිත පාර්ශවය විසින් සිය දිවුරුම් ප්‍රකාශය තුළින් දක්වා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

5 වන වගඋත්තරකරු වන ගම්පොළ මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් 2024.07.17 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් 2024.06.24 දින දූෂණ මර්ධන අංශයේ ස්ථානාධිපති පො.ප.කුමාරසිංහ නිලධාරියාට ලැබුණු තොරතුරකට අනුව එම නිලධාරියා ඇතුළු අංශයේ නිලධාරීන් කණ්ඩායම විසින් මෙම වැටලීම සිදු කිරීමට යාමේ දී ගම්පොල, පහළ ගෙදර, උඩුදෙණිය, අංක 455 ලිපිනයේ පදිංචි මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන කස්තුරි ආරච්චිලාගේ දිනේෂ් සෙනෙවිරත්න යන අය හෙරොයින් මිලිග්‍රෑම් 2113 ක් ලඟ තබා ගැනීමේ වරදට හා අයිස් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 1200 ලඟ තබා ගැනීමේ වරදට අත් අඩංගුවට ගෙන ඇති බව සඳහන් කර ඇත.

එසේම, එම සැකකරු පො.ප.කුමාරසිංහ නිලධාරියා ඇතුළු නිලධාරීන් විසින් අත් අඩංගුවට ගැනීමට යන අවස්ථාවේදී හා සැකකරු අත්අඩංගුවට ගෙන ස්ථානයට රැගෙන ඒම සඳහා ත්‍රීවීල් රථයට නංවා ගැනීමේදී නිලධාරීන්ගේ ග්‍රහණයෙන් මිදී පලා යාමට උත්සහ කර ඇති බවත්, එම අවස්ථාවේදී නිලධාරීන් විසින් දැඩි පරිශ්‍රමයක් දරා සැකකරු මෙල්ල කර ගැනීමට උත්සහ කළ අවස්ථාවේදී සැකකරු ත්‍රීරෝද රථයෙහි හිස ගසා ගනිමින් අත්අඩංගුවට ගැනීමට ප්‍රතිරෝධය පා ඇති බවත්, පසුව සැකකරු මෙල්ල කරගෙන ත්‍රීවීල් රථයෙන් පොලිස් ස්ථානයට රැගෙන විත් සැකකරු ඉදිරියේ උපසේවයේ ඇති ඉලෙක්ට්‍රොනික් තරාදියෙන් හෙරොයින් පාර්සල් කිරා බැලීමේදී හෙරොයින්

මිලිග්‍රෑම 2113 ක් අයිස් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 1200ක් ළඟ තිබී ඇති බවත් 5 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

තවද, මෙම සැකකරු සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයේදී සැකකරු මත්ද්‍රව්‍ය ජාවාරම සිදු කරන බවට තොරතුරු අනාවරණය වූ බැවින් සැකකරු සම්බන්ධයෙන් ගම්පොල ම/උ බී 693/2024 යටතේ අධිකරණයට කරුණු වාර්ථා කර 2024.06.25 දින සිට 2024.06.27 දින දක්වා රැඳවුම් නියෝග ලබාගෙන පොලිස් ස්ථානයේ රඳවා තබා ගනිමින් විමර්ශනය සිදු කර ඇති බවත්, අනතුරුව ගම්පොල, උඩුදෙණිය, අංක 455 ලිපිනයේ පදිංචි කස්තුරි ආරච්චිලාගේ දිනේෂ් සෙනෙවිත්න යන අය හෙරොයින් ජාවාරම සිදු කරමින් හෙරොයින් මිලිග්‍රෑම් 2113ක් ළඟ තබා ගැනීමට අදාළව අත්අඩංගුවට ගෙන 1984 අංක 13 දරණ අන්තරාදායක විෂ මත්ද්‍රව්‍ය ආඥා පනතේ 78(5) (අ),(ආ) සහ 54(1) (අ),(ආ), (ඇ) යටතේ 2024.06.27 වෙනි දින ගම්පොල ම/උ බී 693/24 යටතේ ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මෙම සැකකරු රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති බවත් 5 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

2024.11.20 වන දින මෙම පැමිණිල්ලට අදාළව දෙපාර්ශවයේ සහභාගීත්වයෙන් කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී 1 වන, 2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් සඳහන් කර ඇත්තේ, 4 වන වගඋත්තරකරු වෙත ලැබුණු තොරතුරක් මත 2024.06.24 වන දින අදාළ වැටලීම සිදු කර වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගෙන පරීක්ෂා කිරීමේ දී ඔහු සන්තකයේ අයිස් සහ හෙරොයින් යන මත්ද්‍රව්‍ය තිබීම හේතුවෙන් අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බවත්, අත්අඩංගුවට ගැනීමේ දී කිසිදු පහරදීමක් වින්දිත පාර්ශවය වෙත සිදු කර නොමැති බවත්, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී ඔහු විසින් දැඩි විරෝධයක් දක්වමින් බිම ඇද වැටෙමින් එය වැළැක්වීමට උත්සහ කිරීම හේතුවෙන් ඉතා අපහසුවෙන් ඔහුව ඔසවාගෙන ත්‍රී රෝද රථයට දමාගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන යනු ලැබූ බවත් ය.

**<u>නිරීක්ෂණ</u>**

මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන කේ.ඒ. දිනේශ් සෙනෙවිරත්න යන අය අත්අඩංගුවට ගැනීමට අදාළ 1 වන, 2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් 2024.06.24 වන දින පැය 07.00ට ගම්පොල පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ ඇති දූෂණ වැටලීම් තොරතුරු සටහන් පොතේ පිටුව 126 ඡේදය 295 හි සටහන් යොදා පිටව ගොස් ඇති බව පෙනී යයි. එසේම, 2024.06.24 වන දින පැය 23.00ට ගම්පොල පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ ඇති දූෂණ වැටලීම් තොරතුරු සටහන් පොතේ පිටුව 134 සහ ඡේදය 302හි ඇතුළත් කර ඇති සටහන අනුව 1 වන, 2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් 2024.06.24 වන දින පැය 21.45ට වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගැනීම සිදුකළ බවට සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

වින්දිත පාර්ශවයට අදාළව ගම්පොල රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති අංක 96/24 දරණ අධිකරණ වෛද්‍ය වාර්ථාවේ රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය සටහන් කිරීමේදී පොලිසිය විසින් 2024.06.24 වන දින සවස 4.30ට පමණ නිවසට පැමිණ අත්අඩංගුවට ගත් බව සටහන් කර ඇති බැවින් හා බන්ධනාගාර රෝහලේ වෛද්‍යවරයා විසින් නිකුත් කර ඇති 2024.07.03 දිනැති වෛද්‍ය සහතිකයේද පැමිණිලිකරු ලබා දී ඇති තොරතුරු වල අත්අඩංගුවට ගැනීම 2024.06.24 දින සවස 4.00 ට පමණ සිදුවූ බව සටහන් කර ඇති බැවින් පොලිසිය විසින් වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගත් වේලාව පිළිබඳ ගැටලුකාරී තත්ත්වයන් පෙන්නුම් කරයි.

පැමිණිල්ලේ වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් තබා ඇති සටහන් වල දැක්වෙන්නේ 2024.06.24 වන දින ස්ථානාධිපතිගේ නියෝග අනුව වැටලීම් රාජකාරි සඳහා පිටව ගිය බවත්, විශේෂ කාර්යංශයේ නිලධාරීන් හා වසම භාර පොලිස් නිලධාරීන් ලබා දුන් තොරතුරු අනුව පැමිණිලිකරු පදිංචිව සිටින ප්‍රදේශයට ගිය බවත්, එහි දී වින්දිතගේ නිවස අසල මාර්ගයේදී වින්දිත පාර්ශවය පරීක්ෂා කිරීමේ දී ඔහුගේ කලිසම් සාක්කුවේ තිබූ කොළ පැහැති ෂොපින් බෑගයක ඔතන ලද හෙරොයින් හා අයිස් මත්ද්‍රව්‍ය හමුවීමෙන් පසු ඔහුව අත්අඩංගුවට ගෙන ඔහුගේ නිවසට ගොස් නිවසේ උඩුමහලේ පිහිටා ඇති ඔහුගේ කාමරය පරීක්ෂා කළ ද එහිදී කිසිදු මත්ද්‍රව්‍යක් සොයා ගැනීමට නොහැකි වීමෙන් පසු පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත් ය.

5 වන වගඋත්තරකාර දූෂණ මර්ධන අංශයේ ස්ථානාධිපති විසින් පො.ප.කුමාරසිංහ විසින් වින්දිත පාර්ශවය 2024.06.25 වන දින අංක බී/693/24 යටතේ ගම්පොල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර දින දෙකකට රැඳවුම් නියෝගයක් ලබා ගෙන ගම්පොල පොලිස් ස්ථානයේ රඳවා තබාගෙන ඇති බවත්, 2024.06.27 දින නැවත අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති බවත් නිරීක්ෂණය වේ.

වින්දිත පාර්ශවය අත්අඩංගුවට ගැනීමට අදාළව වගඋත්තරකාර නිලධාරීන් විසින් තබා ඇති සටහන් වල වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහු විසින් අත්අඩංගුවෙන් මිදී පලා යාමට උත්සහ කළ බවත්, එක් පොලිස් නිලධාරියෙකුට වින්දිත පාර්ශවය විසින් පයින් පහරක් එල්ල කළ බවත්, වින්දිත තැනැත්තා කාපට් මාර්ගයේ ඇද වැටුනු බවත්, වින්දිත තැනැත්තා ත්‍රීරෝද රථයෙන් පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමේදී එකී රථයේ සිය ඔලුව ගසා ගත් බවත් සඳහන් කර ඇති නමුත්, 2024.06.24 වන දින පැය 23.00ට ගම්පොල පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ ඇති දූෂණ වැටලීම් තොරතුරු සටහන් පොතේ පිටුව 134 ඡේදය 302 හි 4 වන වගඋත්තරකාර නිලධාරියා විසින් වින්දිත තැනැත්තාගේ බාහිරින් කිසිදු තුවාලයක් නොමැති බවට සටහන් කර ඇති බව පෙනී යයි.

අධිකරණ වෛද්‍ය පෝරම අංක 693/24 යටතේ ගම්පොල මූලික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී සචින්ත රණතුංග මහතා විසින් වින්දිතව 2024.06.27 වන දින පෙ.ව.10.45ට පමණ

පරීක්ෂාවට ලක් කර ඇති අතර එහිදී පහත සඳහන් පරිදි වින්දිතගේ ශරීරයෙන් නිරීක්ෂණය වී ඇති තුවාල 14 ක් පිළිබඳව සටහන් තබා ඇත.

I. 2cm ප්‍රමාණයේ සීරීමක් වම් ඇසට ඉහළින් නළලේ වම්පස
II. 3x 1cm ප්‍රමාණයේ තැලීමක් වම් ඇසට පහළින්, ඇසෙහි තුවාල නැත
III. 1cm ප්‍රමාණයේ සීරීමක් බෙල්ලේ දකුණු පස
IV. 4cm x 0.5cmප්‍රමාණයේ සීරීමක් පසුපස මධ්‍යයේ
V. 1cm ප්‍රමාණයේ රේඛීය සීරීමක් වම් තන පුඩුවට පහළින්
VI. 1cm ප්‍රමාණයේ සීරීමක් උත්තර ආමාශයික ප්‍රදේශයේ
VII. 0.5cm x 0.5cm ප්‍රමාණයේ සීරීමක් වම් අතේ වැලමිටෙහි ඉදිරිපස
VIII. 0.5cm ප්‍රමාණයේ රේඛීය සීරීම් දෙකක් වම් මැණික් කටුවේ
IX. 1cm ප්‍රමාණයේ රේඛීය සීරීමක් දකුණු මැණික් කටුවේ
X. 1cm ප්‍රමාණයේ රේඛීය සීරීමක් වම් මැණික් කටුවේ පසුපස
XI. 2cmප්‍රමාණයේ රේඛීය සීරීමක් දකුණු බාහුවේ ඉහළ කොටසේ මතුපිට
XII. 6cm ප්‍රමාණයේ රේඛීය සීරීමක් පිටෙහි දකුණුපස ඉහළ කොටසේ
XIII. 3 x 0.5cm ප්‍රමාණයේ තැලීමක් වම් බාහුවේ ඉහළ කොටසේ
XIV. 0.5cm x 0.5cm ප්‍රමාණයේ සීරීමක් යටි තොලෙහි වම්පස ඇතුළත

රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය හා වෛද්‍ය වෛදය වාර්ථාවේ සටහන් වී ඇති තුවාල පිළිබඳ තොරතුරු අනුව වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකරුව වධහිංසාවලට ලක්කර ඇති බව තහවුරු වේ.

වගඋත්තර පාර්ශවය පොලිස් නිලධාරීන් පැමිණිල්ලට අදාළ පරීක්ෂණයේ දී කියා සිටින්නේ වින්දිත අත්අඩංගුවට ගැනීමේ දී පොලිස් නිලධාරියෙකුට පහර දී පලා යෑමට උත්සහ කළ බවත්, එම අවස්ථාවේදී වින්දිත බිම වැටුනු බවත්, ත්‍රීරෝද රථය තුලදී ඔළුව ත්‍රීවිල් රථයේ ගසාගත් බවත් ය. ඒ අනුව වින්දිතගේ හිසෙහි බරපතල තුවාලයක් තිබිය යුතු නමුත්, වෛද්‍ය වාර්ථාවේ සඳහන් වන්නේ වින්දිතගේ නළලෙහි 2cm ප්‍රමාණයේ සීරීමක් ඇති බවයි. අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව වින්දිතගේ නළලේ සීරීම හැර ශරීරයේ තවත් ස්ථාන 13ක පමණ සීරීම් හා තැලීම් තුවාල ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය, වින්දිතගේ පියා සහ වින්දිතගේ ඥාතියෙකු විසින් ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශ මඟින් ද කියා සිටින්නේ සිද්ධිය සිදු වූ අවස්ථාවේදී තමන් ඉදිරිපිට දීම වගඋත්තරකාර නිලධාරීන් විසින් වින්දිතගේ නිවසේ ඉහළ මහලයේ ඇති ඔහුගේ කාමරයට රැගෙන ගොස් අමානුෂික අන්දමින් පහර දුන් බව ඔවුන් දුටු බවයි. ඒ අනුව මෙම සිද්ධිය ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මඟින් ද තහවුරු වන්නේ වගඋත්තරකාර නිලධාරීන් විසින් වින්දිතව වදහිංසාවට ලක්කර ඇති බවයි.

කෙසේ වෙතත් එලෙස නිවස තුළදී වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී සිදු කරන ලද පහර දීම හේතුවෙන් හෝ අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී වින්දිත තැනැත්තා විසින් ඊට ප්‍රතිරෝධය පෑම හේතුවෙන් ඔහුගේ ශරීරයේ තුවාල කිසිවක් දක්නට ලැබුණු බවට පොලිස් ස්ථානයට රැගෙන ඒමෙන් පසුව ඔහුව පරීක්ෂා කළ 4 වන වගඋත්තරකාර නිලධාරියා විසින් සටහන් යොදා නොමැත. එහෙත් පොලිස් භාරයේ සිටි වින්දිත තැනැත්තා 2024.06.27 වන දින නැවත අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගම්පොල මූලික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කළ අවස්ථාවේදී වින්දිත තැනැත්තාගේ ශරීරයේ තුවාල 14ක් ඇති බවට වින්දිත තැනැත්තාගේ ශරීරයේ ඇති බවට සඳහන්ව තිබීම තුළින් වින්දිත තැනැත්තා පොලිස් නිලධාරීන් භාරයේ සිටියදී එකී තුවාල සිදු වී ඇති බවත්, එකී තුවාල වින්දිත තැනැත්තා විසින් අධිකරණ වෛද්‍යවරයා වෙත ලබා දී ඇති රෝගියා විසින් ලබා දී ඇති කෙටි ඉතිහාසයේ සඳහන් පහර දුන් බවට සඳහන් කර ඇති ශරීර ස්ථාන සමඟ සැසඳෙන බවත් නිරීක්ෂණය වේ.

කෙසේවෙතත් මෙම පැමිණිල්ලට අදාළව කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී වගඋත්තරකාර පොලිස් නිලධාරීන් වින්දිතව අත්අඩංගුවට ගැනීමේ දී හා ඉන්පසුව ඔහුට පහර දුන් බවට සිදුකරන චෝදනා ප්‍රතික්ෂේප කරමින් කියා සිටින්නේ තමන්ට ලැබුණු තොරතුරකට අනුව සිදුකරන ලද පරීක්ෂණයේ දී වින්දිත සන්තකයේ හෙරොයින් හා අයිස් මත්ද්‍රව්‍ය තිබීම හේතුවෙන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති බවයි.

ඒ අනුව සලකා බැලීමේ දී වගඋත්තරකාර පාර්ශවය වෙත වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගැනීම සඳහා සාධාරණ හේතුවක් පැවතියේ ද යන්න ගැටලුකාරී වන බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. කෙසේවෙතත් වින්දිත පාර්ශවය සතුව හෙරොයින් සහ අයිස් මත්ද්‍රව්‍ය තිබූ බවත්, ඔහු ඉදිරිපිටදී එහි ප්‍රමාණය මැන බැලූ බවටත් වගඋත්තරකාර පාර්ශවය විසින් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බැවින් සහ එකී නඩුව තවමත් ගම්පොල මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතින බැවින් සහ අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවේ දී වින්දිත තැනැත්තා සතුව මත්ද්‍රව්‍ය නොතිබූ බවට සනාථ කිරීමට තරම් කොමිෂන් සභාව වෙත ප්‍රමාණවත් සාක්ෂි ලැබී නොමැති බැවින් වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගැනීමේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් මේ අවස්ථාවේදී තීරණයක් ලබා දීමට කටයුතු නොකරයි.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් ලෙස ගෙන සලකා බැලීමේදී 1 වන, 2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් වින්දිත පාර්ශවය වෙත ඔහුගේ නිවසේ දී මෙන්ම පොලිස් ස්ථානය තුළ දී ද අමානුෂික ලෙස පහරදීම සිදු කර ඇති බවත්, එකී පහරදීම හේතුවෙන් වින්දිත තැනැත්තාගේ ශරීරයේ විවිධ ස්ථාන වල තුවාල 14ක් දක්නට ලැබෙන බවත් වින්දිත පාර්ශවය වෙත නිකුත් කර ඇති අංක 96/24 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව තහවුරු වේ.

ඒ අනුව 1 වන, 2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති කිසිම තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය යන වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද සැකකරුවකු අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව පොලිස් භාරයේ රඳවා තබා ගැනීමේ දී පොලිස් නිලධාරින්ට ඒ පිළිබඳව තිබෙන වගකීම් සම්බන්ධවත්, ඊට අදාළව නීතිමය ප්‍රතිපාදන පිළිබඳවත් දෙපාර්තමේන්තු නියෝග A-20 මගින් දක්වා තිබියදී ඒ පිළිබඳව නිසි වගකීමක් සහිතව ක්‍රියා නොකර වින්දිත තැනැත්තා වධහිංසාවට ලක් කිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම ද 1 වන, 2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීමට ස්ථානාධිපතිවරයා විෂයෙහි වගකීමක් පවතින බවත්, එසේ කටයුතු නොකළහොත් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම කඩ කිරීම සම්බන්ධයෙන් වගකීමෙන් බැදෙන බවත් **මොහොමඩ් රෂීඩ් ෆාතිමා ෂර්මිලා** එදිරිව **පො.සැ. 31118 කේ.ඩබ්.ජී. නිශාන්ත සහ තවත් අය** **(SC FR Application No. 398/2008)** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ඉහතින් දක්වා ඇති පරිදි 1 වන, 2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගැනීම සඳහා පිටත්ව ගොස් ඇත්තේ 5 වන වගඋත්තරකාර මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකගේ නියෝග මත වන බැවින් සහ පොලිස් ස්ථානය තුළ දී වින්දිත තැනැත්තා වධහිංසනයන්ට භාජනය වී ඇති බව තහවුරු වන බැවින් 5 වන වගඋත්තරකරු විසින් සිය අධීක්ෂණ වගකීම නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත්ව ඇති බව පෙනීයයි.

එසේහෙයින් ඉහත කී නඩු තීරණය තුළින් ද දක්වා ඇති පරිදි 5 වන වගඋත්තරතරු විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම ද උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටී.

01. 1 වන, 2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් එක් අයෙකුගෙන් රුපියල් දසදහස (රු.10,000/)ක මුදලක් බැගින් රුපියල් හතලිස් දහස (රු.40,000/-)ක මුදලක් වින්දිත පාර්ශවය වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

02. 1 වන, 2 වන, 3 වන, 4 වන සහ 5 වන වගඋත්තරකරුවන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2025. 09 . 24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,

ජ්‍යෙෂ්ඨ නීතිඥ,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් වින්දිත පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.